# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2473/15 - 2026 ජනවාරි මස 28 වැනි බදාදා - 2026.01.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

### පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) (අ) වගන්තිය යටතේ කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ (1) (අ) වගන්තිය යටතේ කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ අංක 21 කළුගමුව කොට්ඨාසයට තේරී පත්වූ කුඹල් ගමයලාගේ මාලනී ගුණතිලක අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ අංක 21 කළුගමුව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අංහෙට්ටි ගෙදර සුධර්මා ජානකී දනපාල නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි රත්නායක මුදියන්සේලාගේ හරේන්ද්‍ර බණ්ඩාර රත්නායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) (අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් අංහෙට්ටි ගෙදර සුධර්මා ජානකී දනපාල කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ අංක 21 කළුගමුව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. එම්. එච්. බී. රත්නායක,**
තේරීම්භාර නිලධාරි,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2026 ජනවාරි මස 27 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

EOG 01 - 0274


1A - PG 7498 — 08 (2026/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*